ජනාධිපති නීතිඥ ගරු විනිසුරු ඊවා වනසුන්දර මැතිණිය

සභාපතිනිය

අල්ලස් හා දූෂණ විමර්ෂන කොමිෂන් සභාව

මලලසේකර මාවත කොළඹ 7

## මුදල් අමාත්‍යාංශයේ හා මහා භාණ්ඩාරයේ ලේකම් එස් ආර් ආටිගල මහතා විසින් ජාතික බලශක්ති ප්‍රතිපත්තියට පටහැනිව, අමාත්‍ය මණ්ඩලය නොමග යවමින් හා විවෘත ටෙන්ඩර් කැඳවීමකින් තොරව, රටට විශාල පාඩුවක් සිදු කරන හානිදායක කොන්දේසි ඇතුළත් යුගදනවි බලාගාර ගිවිසුම නිව් ෆෝට්‍රෙස් එනර්ජි (NFE) නම් වූ ඇමරිකන් සමාගම සමග අත්සන් කිරීමේදී අල්ලස් පනතේ 70 වන වගන්තියට පටහැනිව සිදු කරන ලද දූෂනය පිළිබඳ පැමිණිල්ල

(1) 09/08/2019 දින අංක 2035/61 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකාවේ බලශක්ති ප්‍රතිපත්තියේ දස වැදෑරුම් උපායමාර්ගික රාමුව අනුව (අ) ජාතික ආර්ථිකයට ප්‍රශස්ත පිරිවැය සහිතව බල ශක්තිය යොදා ගැනීමත් (ආ) බලශක්ති ක්ෂේත්‍රය තුළ යහපාලනය ශක්තිමත් කිරීම ත් (ඇ) බලශක්තියට අදාළ සෑම ගණුදෙනුවකදීම තරගකාරී ලංසු වලට අනුව මිලදී ගැනීම් සහ ආයෝජන සිදු කිරීමත් (ඈ) බලශක්ති කාර්යක්ෂමතාව සහ පරිසර ආරක්ෂණය උදෙසා දැනට පවතින ඩීසල් බලාගාර ද්‍රවිකෘත ස්වභාවික ගෑස් බලාගාර බවට පරිවර්තනය කිරීමත් කළ යුතුය. පවතින ඩීසල් බලාගාර ද්‍රවිකෘත ස්වභාවික ගෑස් බලාගාර බවට පරිවර්තනය කිරීම සඳහා මීට වසර කිහිපයකට පෙර ආරම්භ වූ පරිපාලන ක්‍රියාමාර්ග අනුව කෙරවලපිටිය යුගදනවි බලාගාරය ආශ්‍රිතව මෙගා වොට් 300ක ද්‍රවිකෘත ස්වභාවික ගෑස් හෙවත් (LNG ) බලාගාරයක් අභිනවයෙන් ඉදි කිරීම සඳහා ටෙන්ඩර් කැඳවන ලද නමුත් ටෙන්ඩර් පටිපාටියේ ඇති වූ අක්‍රමිකතාවයක් හේතුවෙන් රජයට අයත් ලක්දනවි සමාගම අධිකරණය ක්‍රියාවලියකට යොමු වූ අතර එම ක්‍රියාදාමය අත්හිටුවන ලදී.

(2) 12/2/2020 දින අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් මගින් එවකට විදුලිබල අමාත්‍ය මහින්ද අමරවීර මහතා අත්හිටුවන ලද නව ගෑස් බලාගාරය කඩිනමින් ඉදි කළ යුතු බවට ප්‍රතිපත්තිමය තීන්දුවක් ගෙන ඉන්පසුව 2020 ජුනි සහ ජූලි මාසවල දී තවත් අමාත්‍ය මණ්ඩල පත්‍රිකා දෙකක් මගින් එම ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීම සඳහා උපාය මාර්ගික ප්‍රවේශයක් අනුමත කර ගන්නා ලද අතර ඒ අනුව **ජාත්‍යන්තර තරගකාරී මිලගණන් කැඳවීම මගින් ස්වාධීන බලශක්ති නිෂ්පාදකයකු ලෙස ආයෝජකයෙකු සොයාගත යුතු** බවට තීරණය විය. ඒ අනුව **පාවෙන ගෑස් ගබඩාවක්, ඒ සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සහ කෙරවලපිටිය සිට කැළණිතිස්ස දක්වා ගෑස් නල පද්ධතියක් ඉදි කිරීම සඳහා ටෙන්ඩර් කැඳවීමට** තීන්දු කළ අතර ඊට අදාළ සාකච්ඡා ක්‍රියාවලිය සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් සාකච්ඡා කමිටුවක්ද පත් කරනු ලැබීය. එහෙත් ඒ අවස්ථාවේදී **ගෑස් සැපයීමේ කොන්ත්‍රාත්තුව සඳහා ටෙන්ඩර් කැඳවීමක් සිදු නොකරන ලදී.** විදුලි ඉංජිනේරු සංගමයට අනුව යටිතල පහසුකම් ඉදිකිරීම සහ ගෑස් සැපයීම එක් පාර්ශවයකට ලබාදීම තරගකාරී මිලට ගෑස් ලබා ගැනීමට බාධාවක් වන හෙයින් **යටිතල පහසුකම් ඉදිකිරීම සහ ගෑස් සැපයීම එක් පාර්ශවයකට ලබාදීම නොකළ යුතු බවට** ජාතික බලශක්ති ප්‍රතිපත්තියට අනුව විදුලිබල මණ්ඩලය විසින් තීන්දුවක් ගෙන තිබුණි.

(3) එහෙත් 2020 ජූලි මාසයේ දී ඉහත සඳහන් පරිදි ටෙන්ඩර් කැඳවනු ලැබූ යටිතල පහසුකම් ඉදිකිරීමේ ව්‍යාපෘති තුනට අමතරව ඊට ගෑස් සැපයීමද ඇතුළත් යෝජනාවක් නිව් ෆෝට්‍රස් එනර්ජි (NFE) නම් ඇමරිකානු සමාගම වෙනුවෙන් ඇමරිකානු තානාපතිනිය විසින් තමාට ඉදිරිපත් කළ බව මහින්ද අමරවීර විදුලිබල අමාත්‍යවරයා විසින් අමාත්‍ය මණ්ඩලයට දන්වා ඇත. එහෙත් එහිදී පවා අමාත්‍යවරයා විසින් සඳහන් කර ඇත්තේ ආයෝජකයා ජාත්‍යන්තර තරගකාරී ටෙන්ඩර් කැඳවීම මගින් තෝරා ගත යුතු බව ය. ඉන්පසුව විදුලිබල අමාත්‍ය ඩලස් අලහප්පෙරුම මහතා විසින් 19/10/2020

දින ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මගින් ද ඇමරිකානු තානාපතිනිය විසින් නිව් ෆෝට්‍රස් එනර්ජි (NFE) නම් ඇමරිකානු සමාගම වෙනුවෙන් ඉදිරිපත් කළ ව්‍යාපෘති යෝජනාව සමඟ ඊට අදාළව වෙනත් ආයෝජකයන් විසින් ඉදිරිපත් කරන ප්‍රති යෝජනා සියල්ල ඇගයීමට ලක් කළ යුතු බවට යෝජනා කරන ලද අතර ඒ අනුව එම ඇගයීම් කටයුතු සහ ඉදිරි ක්‍රියාමාර්ග සඳහා ව්‍යාපෘති කමිටුවක් සහ ඇගයීම් කමිටුවක් අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරනු ලැබීය.

(4) ඒ අනුව විදුලිබල අමාත්‍යවරුත් විදුලිබල මණ්ඩලයත් විදුලි ඉංජිනේරු සංගමයත් දිගින් දිගටම දැරූ ස්ථාවරය වූයේ **යටිතල පහසුකම් ඉදිකිරීම සහ ගෑස් සැපයීම එක් පාර්ශවයකට ලබාදීම නොකළ යුතු බවත් ආයෝජකයා ජාත්‍යන්තර තරගකාරී ටෙන්ඩර් කැඳවීම මගින් තෝරා ගත යුතු බවත්** ය.

(5) ඒ අනුව ගෑස් සැපයීමේ කොන්ත්‍රාත්තුව නොමැතිව යටිතල පහසුකම් ඉදිකිරීමේ ව්‍යාපෘති තුන සඳහා පමණක් 18/2/2021 දින ටෙන්ඩර් කැඳවන ලද අතර 18/06/2021 දින විවෘත කළ යුතු එම ටෙන්ඩර් තවත් සතියකින් එනම් 25/06/2021 දින දක්වා කාලය දීර්ඝ කරනු ලැබුවද එම කාලය තුළ හෝ නිව් ෆෝට්‍රස් එනර්ජි (NFE) නම් ඇමරිකානු සමාගම ටෙන්ඩර් ක්‍රියාවලියට සහභාගී නොවීය. ඒ වෙනුවට එම සමාගම විසින් 2021 අප්‍රේල් මාසයේදී තරගකාරී නොවන යෝජනාවක් (Unsolicited Proposal) මුදල් අමාත්‍යාංශයට ඉදිරිපත් කර ඇති බව මුදල් අමාත්‍යවරයා විසින් 1/7/2021 දින දරණ තම අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මගින් අමාත්‍ය මණ්ඩලයට දැනුම් දෙනු ලැබීය.

(6) නිව් ෆෝට්‍රෙස් එනර්ජි සමාගම ගෑස් සැපයීම ද ඇතුලත් ආයෝජන ක්‍රියාවලීන් 5ක් සඳහා එකඟ වූ බව එම පත්‍රිකාව මගින් අමාත්‍ය මණ්ඩලයට දන්වා ඇත. ඒ අනුව දැනට ඩීසල් මගින් ක්‍රියාත්මක වන යුගදනවි බලාගාරය ගෑස් බලාගාරයක් බවට පරිවර්තනය කිරීමටත් එම බලාගාරය පාලනය කරන වෙස්ට් කෝස්ට් පුද්ගලික සමාගම (WCPL) නම් වූ රජයට අයත් සමාගමේ කොටස් වලින් 40% මිලදී ගැනීමටත් නිව් ෆෝට්‍රෙස් සමාගම එකඟ වී ඇත. ඊට අමතරව එම සමාගම ඉහත ටෙන්ඩර් කැඳවන ලද ව්‍යාපෘති තුනට අදාළ ආයෝජන වලට මෙන්ම මෙගාවොට් 300ක නව ගෑස් බලාගාරයක් ඉදිකිරීමටත් එකගවී ඇත.

(7) නිව් ෆෝට්‍රෙස් සමාගමේ අදාළ ආයෝජන පිළිබඳව අමාත්‍ය මණ්ඩලය පළමු වරට දැනුවත් කරනු ලබන්නේ එම අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මගිනි. එහෙත් ඊට පෙර නිව් ෆෝට්‍රෙස් සමාගමේ යෝජනා ඇගයීම් සඳහා **භාණ්ඩාගාර ලේකම්වරයා විසින් විශේෂඥ තාක්ෂණික කමිටුවක් පත් කර ඇත.** භාණ්ඩාගාර ලේකම්වරයා විසින් එසේ පත් කළ බව අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවේ සඳහන් වේ. එහෙත් එවැනි කමිටුවක් පත් කිරීම සඳහා ඔහු විසින් මුදල් අමාත්‍යවරයා හරහා ඊට පෙර ඉදිරිපත් කරන ලද පත්‍රිකාවක් මගින් අමාත්‍ය මණ්ඩල අවසරය ලබාගෙන නැත. **විදේශීය ආයෝජකයෙකු සමඟ ව්‍යාපෘති යෝජනාවක් පිළිබඳව සාකච්ඡා කිරීම සහ ව්‍යාපෘතිය ඇගයීම සඳහා කමිටුවක් පත් කිරීම කළ යුත්තේ අමාත්‍ය මණ්ඩලය විසිනි.** ඒ අනුව අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව සකස්කළ මුදල් අමාත්‍යාංශයේ සහ භාණ්ඩාගාරයේ **ලේකම්වරයා ඔහුගේ බලතල ඉක්මවා චේතනාන්විතව ක්‍රියා කර** ඇත.

(8) භාණ්ඩාගාර ලේකම්වරයා විසින් පත්කළ **තාක්ෂණික කමිටු**වට ඇතුළත් වී ඇත්තේ භාණ්ඩාගාර නිළධාරීන්, බලශක්ති අමාත්‍යාංශයේ හා විදුලි බල මණ්ඩලයේ නිලධාරීන් සහ විදුලිය සහ ගෑස් පිළිබඳ විශේෂඥයින් යයි කියන පුද්ගලයන් කිහිප දෙනෙකු පමණකි. එම **කමිටුවට මහජන උපයෝගිතා කොමිසමේ නියෝජිතයකු පත් කර** නොමැත. ඒ බව ඊට පසුව අමාත්‍යවරුන් අතර .මහත් ආන්දෝලනයට ලක්වූ 6/9/2021 දින ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මගින් බව පිළිගෙන ඇත. **මහජන උපයෝගීතා කොමිසම් පනත අනුව ස්වාධීන බලශක්ති නිෂ්පාදකයින්ට අදාළ කොන්දේසි අනුමත කිරීමේ බලය ඇත්තේ එම කොමිසමට** ය. ඒ අනුව **අදාළ කොන්දේසි අනුමත කිරීමේ නෛතික බලය හිමි මහජන උපයෝගීතා කොමිසම** එම **කමිටුවෙන් බැහැර කර** තැබීමට භාණ්ඩාගාරයේ **ලේකම්වරයා සිතාමතා ම** කටයුතු කර ඇති බව පැහැදිලි වේ.

(9) කෙසේ වෙතත් එම විශේෂඥ තාක්ෂණික කමිටුවේ නිර්දේශ මත මූලික ගිවිසුම් රාමුවක් Frame Work Agreement අත්සන් කිරීම සඳහා ඊට පෙර ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මගින් අවසර ඉල්ලා තිබූ අතර අදාළ ගිවිසුම ද පත්‍රිකාවට අමුණා තිබුණි. එහෙත් 1/7/2021 දින දරණ එම අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව 5/7/2021 දින පැවැත්වීමට නියමිත වූ **අමාත්‍ය මණ්ඩල රැස්වීමේ න්‍යාය පත්‍රයට ඇතුළත් කර නොතිබුණි**. ඒ අනුව එම පත්‍රිකාව සහ අදාළ ගිවිසුම **කල්වේලා ඇතිව අමාත්‍යවරුන්ට ලබාදී නොමැති** අතර එය සාකච්ඡාවට ගනු ලබන්නේ අමාත්‍ය මණ්ඩල සාකච්ඡාව යන අතරතුර ය. ඒ අනුව එසේ **අමාත්‍ය මණ්ඩල රැස්වීමට පෙර පත්‍රිකාවේ අඩංගු කරුණු ගැන අමාත්‍යවරුන්ට පූර්ව අවබෝධයක් ලබාගත නොහැකි වන ආකාරයට පත්‍රිකාව ඉදිරිපත් කිරීම සිතාමතා කර ඇති බවට සාධාරණ සැකයක් ඇතිවීම** වැලැක්විය නොහැකි ය. නැවත වරක් 6/9/2021 දින දරන ආන්දෝලනයට ලක්වූ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවට අදාළව ද එලෙසම කටයුතු කර ඇති බැවින් අදාළ කරුණු කෙරෙහි **අමාත්‍යවරුන්ගේ අවධානය යොමුවීම වැළැක්වීම පිණිස භාණ්ඩාගාරයේ ලේකම්වරයා සිතාමතා ම කටයුතු කර ඇති බව** පැහැදිලි ය.

එම දෙවන අවස්ථාවේදී අදාල අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී පවා සාකච්ඡාවට ලක් නොවූ බව ඇතැම් අමාත්‍යවරුන් විසින් මාධ්‍ය වෙත පවසා තිබුණි. එම අමාත්‍යවරුන්ට අනුව ඔවුන් එවැනි පත්‍රිකාවක් සම්මත වූ බව දැන ගනු ලබන්නේ අමාත්‍ය මණ්ඩල රැස්වීමේ වාර්තාව නිකුත් වීමෙන් පසුවය.

(10) 5/7/2021 දින පවත්වන ලද **අමාත්‍ය මණ්ඩල රැස්වීමේ වාර්තාව නිකුත් වීමටත් පෙර** අමාත්‍ය මණ්ඩල **අනුමැතියකින් තොරව හා අදාළ බලධාරී ආයතනය වන මහජන උපයෝගීතා කොමිසමේ සහභාගිත්වයක් නැතිව** තමා විසින් පත් කරන ලද **තාක්ෂණික කමිටුව** මගින් සකසන ලද මූලික ගිවිසුම් රාමුව 7/7/2021 දින අත්සන් කිරීමට මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා ලහි ලහියේ කටයුතු කර තිබුණි. ලේකම්වරයාට එසේ අත්සන් කිරීමට සැබෑ ලෙසම බලය ලැබෙන්නේ අදාල රැස්**වීම්** වාර්තාව සම්මතවීමෙන් පසුව අමාත්‍ය මණ්ඩල ලේකම්වරයා විසින් ඒ බව දැනුම් දීමෙන් පසුවය. මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා මේ කාරණය සම්බන්ධයෙන් මුල සිටම **කටයුතු කළ ආකාරය දෙස බලන විට** ඔහුට එය **අත්සන් කිරීමට තිබූ හදිස්සිය** තේරුම් ගත හැකිය.

(11) එසේම 6/9/2021 දින දරන සහ එදිනම සාකච්ඡාවට ලක්වූ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවට අනුව නව ගෑස් බලාගාරයක් ඉදිකිරීම සඳහා පිහිටුවනු ලැබූ ''සොභාදනවි'' නම් වූ රාජ්‍ය සමාගම සමග භාණ්ඩාගාර ලේකම්වරයා විසින් ක්‍රියාත්මක කිරීමේ ගිවිසුමක් (Implementation Agreement) අත්සන් කර ඇත. මෙගාවෝට් 350ක එම බලාගාරයට අදාළව එවැනි ගිවිසුමක් අත්සන් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතියක් ලබාගෙන නැත. අදාල පත්‍රිකාවට අනුව ඔහු එයට අත්සන් තබා ඇත්තේ අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාගැනීමෙන් පසුවය. එහෙත් 5/7/2021 දින සිට 6/9/2021 දින දක්වා පවත්වන ලද අමාත්‍ය මණ්ඩල රැස්වීම් 8 ක න්‍යාය පත්‍ර පිරික්සීමේ දී පෙනී යන්නේ එම විෂයට අදාළව අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් මුදල් අමාත්‍යංශය විසින් ඉදිරිපත් කර නොමැති බවය. අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කර නොමැති හා අමාත්‍ය මණ්ඩල අනුමැතිය නොලැබූ කරුණක් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබූ කරුණක් වශයෙන් අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක සඳහන් කොට ඉදිරිපත් කිරීමෙන් මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා **සිතාමතා ම අමාත්‍ය මණ්ඩලය නොමග යැවීමට කටයුතු කර ඇත**. එවැනි **පත්‍රිකාවක් න්‍යාය පත්‍රයට ඇතුළත් නොකර සාකච්ඡාවට ගැනීම** ද එවැනිම **නොමග යැවීමේ ක්‍රියාවකි**.

(12) ඊට අමතරව ඇමරිකාවේ **නිව් ෆෝට්‍රෙස් සමාගම විසින් 13/7/2021 දින නිකුත් කරන ලද නිවේදනයකට අනුව** එම සමාගම විසින් ශ්‍රී ලංකාවේ ලක්දනවි සමාගම සමඟ මෙගාවොට් 350 ක නව ගෑස් බලාගාරයක් ඉදිකිරීම සඳහා අවබෝධතා ගිවිසුමක් අත්සන් කර ඇත. එසේම එම සමාගම 8/7/2021 දින ශ්‍රී ලංකාවේ භාණ්ඩාගාර ලේකම් සමඟ මූලික ගිවිසුම් රාමුවක් අත්සන් කළ බව ද එම නිවේදනයේම සඳහන් වේ. ඒ අනුව 7/7/ 2021 භාණ්ඩාගාර ලේකම් ඇමරිකාවේ නිව් ෆෝට්‍රෙස් සමාගම සමග මූලික ගිවිසුම් රාමුවක් අත්සන් කර ඇති බව ද එම සමාගම ලක්දනවි සමාගම සමඟ

අවබෝධතා ගිවිසුමක් අත්සන් කර ඇති බව ද සනාථ වේ. එහෙත් ඉහත සඳහන් කර ඇති පරිදි **1/7/2021 අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මගින්** හෝ ඊට පසුව **6/9/2021 දින අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මගින් එවැනි අවබෝධතා ගිවිසුමක් අත්සන් කළ බව පිළිගෙන නැත**. ඒඅනුව මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා **එම තොරතුරු අමාත්‍ය මණ්ඩලයට වසන්** කොට තබා ගෙන සිතාමතා ම හෝ දැනුවත් ව **අමාත්‍ය මණ්ඩලය නොමග යැවීමට** කටයුතු කර ඇත. කෙසේ වෙතත් අවසානයට, එනම් 6/9/2021 දින, ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මගින් ඇමරිකාවේ නිව් ෆෝට්‍රෙස් සමාගම සමග කොටස් විකිණීම සහ මිලදී ගැනීමට අදාළ ගිවිසුමක් (Share Sales and Purchase Agreement) අත්සන් කිරීමට බලය ලබා දී ඇත.

(13) විදේශීය ආයතනයක් සමග ගිවිසුමක් ඇතිකර ගැනීමට අනුමැතිය ලබා ගැනීමට පෙර ගිවිසුමේ අඩංගු වන්නේ කුමක්දැයි දැන **ගැනීමේ අයිතියක් වගකීමක් හා යුතුකමක් අමාත්‍ය මණ්ඩලයට ඇත.** අනුමැතිය ලබා ගැනීමට පෙර ගිවිසුමේ අඩංගු වන්නේ කුමක්දැයි අමාත්‍ය මණ්ඩලයට දැන ගැනීමට සැලැස්වීම. ගිවිසුමක් සකස් කොට ඇත්නම් එහි පිටපතක් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ වගකීම හා යුතුකම වේ. ඇමරිකාවේ නිව් ෆෝට්‍රෙස් සමාගමට වෙස්ට් කෝස්ට් සමාගමේ කොටස් විකිණීමේ ගිවිසුම් අඩංගු වන්නේ කුමක්දැයි **අමාත්‍යවරුන් ගේ දැන ගැනීම සඳහා වෙස්ට් කෝස්ට් සමාගමේ කොටස් විකිණීම සහ මිලදී ගැනීමට අදාළ ගිවිසුමේ පිටපතක්** 6/9/2021 දින **අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව සමග ඉදිරිපත් කර නොතිබුණි**. ඒ වෙනුවට අදාළ සමාගමේ ගෑස් විකිණීමට අදාළ කොන්දේසි අඩංගු ගිවිසුම (GSTS) අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවට අමුණා තිබුණි. ඒ අනුව වෙස්ට් කෝස්ට් සමාගමේ **කොටස් විකිණීමට අදාළ ගිවිසුම ඉදිරිපත් නොකිරීම** නංගි පෙන්වා අක්කා දීම වැනි **වංචනික ක්‍රියාවකි.**

**(14)** එසේ **අමාත්‍ය මණ්ඩලයේ අනුමැතියට ලක්නොවූ ගිවිසුමක් අත්සන් කිරීම මගින් ශ්‍රී ලංකා රජය විදේශීය සමාගම් සමග බැඳීම් වලට යටත් කර ලීමෙන්** මුදල් අමාත්‍යාංශ ලේකම්වරයා කර ඇත්තේ **සිය බලතල ඉක්මවා ගිය අත්තනෝමතික ක්‍රියාවකි.**

(15) එම ගිවිසුම අත්සන් කිරීමෙන් පසුව එය අමාත්‍ය මණ්ඩලයේ පසු අනුමැතිය (Ratification) සඳහා ඉදිරිපත් කරන බව අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවේ සඳහන් කර ඇත. රජය වෙනුවෙන් රජයේ විධායක බලතල ක්‍රියාත්මක කරන **ඉහළ රාජ්‍ය නිලධාරීන් අමාත්‍ය මණ්ඩලයේ පසු අනුමැතිය සඳහා ඉදිරිපත් කරන බව පවසා විදේශීය සමාගම් සමග රට බැඳ තබන ගිවිසුම් වලට එළඹෙන්නේ කෙසේද?** එය රාජ්‍ය නිලධාරියා කරන ක්‍රියාවන් ඒවායේ පල විපාක නොසලකා අනුමත කරන ලෙස **අමාත්‍ය මණ්ඩලයට කරන අනියම් බලපෑමකි. අමාත්‍ය මණ්ඩලයට ජනතාව විසින් ලබා දී ඇති පරමාධිපත්‍ය බලය හාස්‍යයට ලක්** කිරීමකි. එය වඩාත් බරපතල වරදක් බවට පත්වෙන්නේ රජයේ හා රටේ මූල්‍ය කටයුතු මෙහෙයුමට අදාල අමාත්‍ය මණ්ඩලය සතු පරමාධිපත්‍ය බලය ක්‍රියාත්මක කිරීම සඳහා බලය පවරනු ලබන ඉහළම රාජ්‍ය නිලධාරියා භාණ්ඩාගාර සහ මුදල් අමත්‍යාංශ ලේකම්වරයා වන බැවිනි.

(16) එසේම මෙම සමස්ථ ක්‍රියාවලිය තුළ **තරගකාරී ටෙන්ඩර් කැඳවීමකින් තොරව ආයෝජකයා තෝරා ගැනීම මගින් 2019දී ගැසට් කරන ලද රජයේ බලශක්ති ප්‍රතිපත්තිය බරපතළ ලෙස උල්ලංඝණය** වන අතර සුදුසු ම හා රටට වාසිදායක ම ආයෝජකයා තෝරා ගැනීමට නොහැකි වීමෙන් රටට සිදුවන්නේ බරපතල පාඩුවකි.

(17) භාණ්ඩාගාර සහ මුදල් අමත්‍යාංශ ලේකම්වරයා විසින් **නිසි ලෙස ලබාගත් අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව, තරගකාරී ටෙන්ඩර් කැඳවීමක් සිදු නොකොට, ජාතික බලශක්ති ප්‍රතිපත්තියට පටහැනිව** ඇමරිකාවේ නිව් ෆෝට්‍රෙස් සමාගම සමඟ අත්සන් කොට ඇති ගිවිසුම් නිසා රජයට සිව් ආකාරයකින් පාඩු සිදුව ඇත:

<u>පාඩු සිදුව ඇති පළමුවන ආකාරය</u>

(අ) ගැසට් කර ඇති **ජාතික බලශක්ති ප්‍රතිපත්තිය අනුව ජාත්‍යන්තර තරගකාරී ටෙන්ඩර් කැඳවීමක් සිදු නොකොට** යුගදනවි බලාගාරයේ කොටස් වලින්

සියයට 40 ඇමරිකානු නිව් ෆෝට්‍රෙස් සමාගමට විකිණීමට ගිවිස ගැනීම නිසා **යුගදනවි බලාගාරයේ එම කොටස් සඳහා ලබාගත හැකි ඉහළම මිල ලබා ගැනීමේ අවස්ථාව රජයට අහිමි කර ඇත. ගෑස් සැපයීමේ කොන්ත්‍රාත්තුව හා ගෑස් සැපයීමට අදාළ යටිතල පහසුකම් සැලසීමේ කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් ද සිදුව ඇත්තේ එයයි. අඩුම මිලකට ඒවා ලබා ගැනීමේ අවස්ථාව රජයට අහිමි කර ඇත.**

නිදසුනක් ලෙස **අදාළ ඉංජිනේරු ක්ෂේත්‍රයේ විශේෂඥයන්ට අනුව ඩොලර් මිලියන 200කට පමණ පාවෙන ගෑස් ගබඩාවක් (FSRU) මිලදී ගත හැක. සෙසු ටෙන්ඩර් දෙක වන ගබඩාව රඳවනු ලබන යටිතල පහසුකම් (Mooring System) සහ නල එලීම යන ආයෝජන සඳහා පිළිවෙළින් වැය වන්නේ ඩොලර් මිලියන 30ක් සහ ඩොලර් මිලියන 25 ක් පමණි. ඒ අනුව ඒ සියල්ලේ එකතුව ඇමරිකානු සමාගම විසින් ගෑස් ධාරිතාව පවත්වාගෙන යාම සඳහා අයකරන ඩොලර් මිලියන 253 ට වඩා අඩුවේ.** එසේ නැතහොත් යුගදනවි බලාගාරයේ කොටස් 40% විකුණා ලබා ගන්නා මුදලට සමාන වේ.

<u>පාඩු සිදුව ඇති දෙවන ආකාරය</u>

(ආ) **ගෑස් සැපයීම සඳහා යටිතල පහසුකම් ඉදිකිරීමත් ගෑස් සැපයීමත් එක් පාර්ශවයකට ලබාදීම නොකළ යුතු බවට** විදුලිබල මණ්ඩලය ප්‍රතිපත්තිමය තීන්දුවක් ගෙන තිබුණි. ඒ **ගෑස් සැපයීමට අදාළ යටිතල පහසුකම් සැලසීමත් සහ ගෑස් සැපයීමත් එක් පාර්ශවයකට ලබා දුන හොත් තරගකාරී මිලට ගෑස් ලබාගැනීමේ අවස්ථාව අහිමි වී රටට** විශාල පාඩුවක් සිදුවන හෙයිනි. විදුලිබල මණ්ඩලය මගින් **පළමුව ටෙන්ඩර් කැඳවන** ලද්දේ (1) FSRU නම් වූ පාවෙන ගෑස් ගබඩාව සහ (2) එය රැඳවීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම මෙන්ම (3) කෙරවලපිටිය සිට කැලණිතිස්ස බලාගාරය දක්වා නල පද්ධතිය ඉදිකිරීම යන **කොන්ත්‍රාත් තුන සඳහා** පමණි. **ගෑස් මිල දී ගැනීම** එම කොන්ත්‍රාත් තුනට **ඇතුළත් නොවී ය.** ඒ අනුව ගෑස් මිල දී ගැනීම වෙන් වෙන් වශයෙන් තරගකාරී මිලගණන් වලට අනුව සිදුකිරීමේ හැකියාව පැවතුනි. එහෙත් ඒ අනුව **කැඳවූ ටෙන්ඩර් එසේම තිබියදී ටෙන්ඩර් පටිපාටියට පිටින් ගොස් කළ විශේෂ කැඳවීමක් අනුව ඇමරිකානු සමාගමට යටිතල පහසුකම් සහ ගෑස් සැපයීම යන සමස්ත පද්ධතිය පවරාදීම නිසා ගෑස් සැපයීමේ ඒකාධිකාරයක් ඇමරිකානු සමාගමට ලැබෙන අතර තරගකාරී මිලට ගෑස් ලබාගැනීමේ අවස්ථාව අහිමි වී ගෑස් මිළ දී ගැනීමේදී දීර්ඝකාලීනව විශාල පාඩුවක් රටට සිදුවේ.**

<u>පාඩු සිදුව ඇති තුන්වන ආකාරය</u>

(ඇ) **යුගදනවි බලාගාරයේ රජය සතු කොටස් 40 % ක් විකුණා ඩොලර් මිලියන 250ක් ලබා ගන්නා අතර ජාත්‍යන්තර ටෙන්ඩර් කැඳවීමකින් තොරව LNG ගෑස් සැපයීමේ කොන්ත්‍රාත්තුව ඇමරිකානු (NFE) සමාගමට ලබාදීම නිසා වසර 5ක් සඳහා ධාරිතා ගාස්තු වශයෙන් පමණක් ගෙවීමට සිදුව ඇති මුදල ඩොලර් මිලියන 253කි. වසර 5ක දී ගෑස් සැපයීම මගින් පමණක් එම සමාගම ඉපයීමට නියමිත ආදායම ඩොලර් මිලියන 6000** කි. **ජාත්‍යන්තර ටෙන්ඩර් කැඳවීමක් සිදු කරන ලද නම් මෙයට වඩා බෙහෙවින් අඩු මුදලකට මෙම ගනුදෙනුව සිදු කර ගැනීමේ හැකියාව තිබුණි. ටෙන්ඩර් කැඳවීමකින් තොරව ගෑස් සැපයීමේ සහ අදාල යටිතල පහසුකම් ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව මගින් ඇමරිකානු සමාගමට ලබාදෙන ලද ඒකාධිකාරිය නිසා දීර්ඝ කාලීනව රටට සිදුවන අනර්ථය** ඉතා **විශාල ය.**

<u>පාඩු සිදුව ඇති සිව්වන ආකාරය</u>

(ඈ) **ඇමරිකානු සමාගම සමග එළඹ ඇති මෙම ගිවිසුම අනුව බලාගාරවල භාවිතාවට අවශ්‍ය ප්‍රමාණයට වඩා වැඩි ගෑස් ප්‍රමාණයක් මාස් පතා සමාගමෙන් මිලදී ගැනීමටත් එසේ භාවිතාවට නොගන්නා ගෑස් සඳහා මුදල් ගෙවීමටත් ආණ්ඩුව බැඳී සිටී.** මෙම **ගෑස් සැපයීමේ ගිවිසුම අනුව මෙගාවොට් 300ක යුගදනවි බලාගාරය සහ මෙගාවෝට් 350ක අනාගත සොබාදනවි බලාගාරයට අමතරව කැළණිතිස්ස බලාගාරය ගෑස් වලට පරිවර්තනය කිරීම ආදිය මගින් උපරිම වශයෙන් මෙගාවෝට් 900ක් සඳහා ගෑස් අවශ්‍යතාවය** සපිරීමට නියමිතය. එහෙත් **එම සමාගමට මෙගාවෝට් 1600ක් සඳහා ධාරිතාවයක් පවත්වාගෙන යාමට ඉඩ දීම** නිසා ඉහත සඳහන් කළ අධික ධාරිතා ගාස්තුවලට අමතරව **භාවිතා නොකළ ද මිලදී ගැනීමට සිදුවන අවම ගෑස් ප්‍රමාණයක්** නියම වේ. ඒ අනුව **ඇමරිකානු සමාගමට සෑම මසකම ඊට පෙර මාසයේ දී බලාගාරවලට විකුණන ලද ගෑස් නැවත විකිණීමට හැකියාව** ලැබේ. ඒ මගින් රජයට බරපතළ දීර්ඝකාලීන පාඩුවක් සිදුවන අතර විදුලිබල මණ්ඩලයේ පාඩුව පමණක් නොව විදුලි බිල ද ඉහළ යාම සිදුවනු ඇත. ඊට අමතරව ඒ අයුතු බැඳීම නිසා විදුලිබල මණ්ඩලයට සෙසු පුනර්ජනණීය බලශක්ති උත්පාදනය සඳහා අනාගතයේ දී ඇති විය යුතු උනන්දුව ද අඩුවනු ඇත.

මුදල් අමාත්‍යාංශයේ හා මහා භාණ්ඩාරයේ ලේකම් එස් ආර් ආටිගල මහතා විසින් ජාතික බලශක්ති ප්‍රතිපත්තියට පටහැනිව, අමාත්‍ය මණ්ඩල අනුමැතිය

නොමැතිව හා අමාත්‍ය මණ්ඩලය නොමග යවමින්, විවෘත ජාත්‍යන්තර ටෙන්ඩර් කැඳවීමකින් තොරව, නිව් ෆෝට්‍රෙස් එනර්ජි (NFE) නම් වූ ඇමරිකන්

සමාගම සමග අත්සන් කර ඇති ගිවිසුම මගින් අදාළ විදේශීය සමාගමට විශේෂ අනුග්‍රහයන් දක්වමින් අයුතු ලාභ ලැබීමට අවස්ථාව සලසා දී ඇති අතර ශ්‍රී ලංකාවේ
රජයට දීර්ඝකාලීනව බලන විට බැඳුම්කර වංචාවට නොදෙවෙනි පාඩුවක් සිදුකර ඇත. චේතනාන්විතව හෝ දැනුවත්ව සිදුකර ඇති එම ක්‍රියාව පැහැදිලි ලෙසම අල්ලස් පනතේ
70 වන වගන්තිය යටතට ගැනෙන දූෂනයකි.

එස් ආර් ආටිගල මහතා විසින් සිදුකර ඇති එම දූෂන ක්‍රියා සම්බන්ධයෙන් අල්ලස් පනත යටතේ විමර්ශනයක් සිදු කොට ඒ මහතාට එරෙහිව නීතිමය පියවර ගන්නා මෙන් අපි අල්ලස් හා දූෂන විමර්ශන කොමිසමෙන් ඉල්ලා සිටිමු.

**S. 70 Bribery (Amendment) Act No. 20 of 1994**

S. 70 – Any public servant who, **with intent**,

- to cause wrongful or unlawful loss to the Government, or

- to confer a wrongful or unlawful benefit, favour or advantage on himself or any other person; or

- **with knowledge**,

- that any wrongful or unlawful loss will be caused to any person or to the Government, or

- that any wrongful or unlawful benefit, favour or advantage will be conferred on himself or any wrongful or unlawful benefit, favour or advantage will be conferred on any other person -

(a) does or forbears to do, any act, which he is empowered to do by virtue of his office as a public servant;

(b) induces any other public servant to perform. or refrain from performing any act, which such public servant is empowered to do by virtue of his office as a public servant;

© uses any information coming to his knowledge by virtue of his office as a public servant;

(d) participates in the making of decision by virtue of his office as a public servant;

(e) induces any other person, by the use, whether directly or indirectly, of his office as a public servant to perform. or refrain from performing any act,

- shall be guilty of the offence of corruption and shall upon summary trial and conviction by a Magistrate be liable to imprisonment for a term not exceeding ten years or to a fine not exceeding Rs. 100,000 or to both.

“**Public servant**” includes a Minister of the Cabinet, Speaker of Parliament, any MP, every officer, servant or employee of the state.